# විශේෂ අවශ්‍යතා ඇත්තන්ගේ
## මානව අයිතිවාසිකම්



ශ්‍රී ලංකා මානවහිමිකම් කොමිෂන් සභාව

සැකසුම : නීතිඥ නිමල් පී පුංචිහේවා

# මානව හිමිකම් කොමිෂන් සභාවේ
# ලේකම්තුමියගේ පණිවිඩය ...............

ආබාධිත පුද්ගලයන්ට අදාල වන ජාත්‍යන්තර/දේශීය නීති තිබේ. ඒ සම්බන්ධව කටයුතු කරන ආයතන පිළිබඳ තොරතුරු ඇතුලත් පොත් පිංචක් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එළි දැක්වීමට කටයුතු කර ඇත.

එකම පොතක අදාල සියළුම තොරතුරු කැටිකර සමාජයට ප්‍රදානය කිරීමට දිගු කාලීන අවශ්‍යතාවයක් කොමිෂන් සභාව විසින් අවබෝධ කර ගෙන තිබුනි.

මානව හිමිකම් කොමිෂන් සභාවේ අතිරේක ලේකම් (නීති) නීතීඥ නිමල් පී. පුංචිහේවා මහතා විසින් මෙම විෂය තුල එතුමාගේ ඇති දැනුම මෙම පොතට ඇතුලත් කර, මෙම ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන්නන්ට පරිශීලනය කල හැකි අත් පොතක් ලෙස එළි දැක්වීම ඉතාමත් අගය කල හැකි වේ.

සමාජයේ විවිධ දුර්වලතා ඇති අයට සමාන අයිතිවාසිකම් සහ ගරුත්වය ලබා දීමෙ එක් පියවරක් ලෙස මෙම පොත තුලින් වන දැනුවත් කිරීම ඉතා අගය කල යුතුය.

චන්ද්‍රා එල්ලාවල,
ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

# පටුන


01 හැඳින්වීම

02 ආබාධිත තත්ත්වයන් ඇති වීමට හේතු වන කාරණා

03 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනය හා ආබාධිත පුද්ගල අයිතීන්

04 ජාත්‍යන්තර ප්‍රඥප්ති/ප්‍රකාශන හා ආබාධිත පුද්ගල අයිතිවාසිකම්

05 ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (ICESCR)

06 අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO)

07 එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)

08 එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO)

09 විශ්ව තැපැල් සංවිධානය (UPU)

10 එක්සත් ජාතීන්ගේ විපත් සහන සමායෝජිත කාර්යාලය (UNDRO)

11 සරනාගතයින් සඳහා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR)

12 ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO)

13 ආබාධිතයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව පිළිගත් එකඟතා

14 ආබාධිතයන්ට පහසුකම් සැලසීමට සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සංගමය මහලේකම් කාර්යාලයට සම්බන්ධ ආයතන

15 ආබාධිත පුනුරුත්ථාපන වැඩ සටහනට සම්බන්ධ කලාපීය ආයතන

16 ආබාධිතයන් සඳහා දැනට ක්‍රියාත්මක වන ජගත් වැඩ සටහන්

17 ආබාධිතයන්ගේ අයිතිවාසිකම් හා ශ්‍රී ලංකා නීති

- 17.1 1996 අංක 28 දරණ පනත
- 17.2 මහ ලේකම් කාර්යාලය
- 17.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/88
- 17.4 පාසැල්

18 සේවා සලසන ස්වෙච්ඡා ආයතන

19 ජාත්‍යන්තර ආයතන

20 අධිකරණ තීරණ

21 ආබාධිත අයිතිවාසිකම් සම්බන්ධ පොදු කරුණු

# විශේෂ අවශ්‍යතා ඇත්තන් හා මානව අයිතිවාසිකම් හැඳින්වීම

## හැඳින්වීම

විශේෂ අවශ්‍යතා ඇත්තන් (ආබාධිත) යනුවෙන් හැඳින් වෙන්නේ කුමන පුද්ගලයන්ද?

- අඳ - Visually Disable (blind)
- ගොළු - Speech Disable (Dumbness)
- බිහිරි - Hearing Disable (Deanfiness)
- මන්ද මානසික - Mental Disable (Retardness)
- කායික දුබලතා - Arthopaedic Disable

යන පුද්ගලයන් අදහස් කෙරේ

ආබාධිත පුද්ගලයන්ටද මානව හිමිකම් සියලු මානවයන් සඳහා යන ප්‍රතිපත්තිය මත පිහිටා වෙනස් කමකින් තොරව ජීවත් වීමට හැකිවීමට ක්‍රියා කිරීමට ඇති අයිතිය තහවුරු කරවා ගැනීමේ අයිතිය පවතී.

## ආබාධිත තත්වයන් ඇති වීමට හේතුවන කාරණා

යුද්ධය, වසංගත ස්වභාවික විපත් හා භූමි කම්පා, දිළිඳු බව, නූගත් බව හා සෞඛ්‍යය අධ්‍යාපනය පිළිබඳව නොදැනුවත්කම, අධික ලෙස ජනාකීර්ණ වීම, හා සෞඛ්‍යයට අහිත කර නිවාස හා ජීවන තත්ත්වයන්, මහජන ආධාර, සෞඛ්‍යය අධ්‍යාපන, වෘත්තිය පුහුණුව හා රැකියා සැපයීම වැනි සේවාවනට අදාළ සවිතල සේවා නොමැති වීම හෝ ඒවා දුර්වල වීම, පරිසර දූෂණය, අනවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය භාවිතය වැනි කරුණු

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශණය හා විශේෂ අවශ්‍යතා ඇත්තන්ගේ අයිතීන්

1948 දෙසැම්බර් 10 දින ප්‍රකාශයට පත් වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශණය මගින් පුද්ගල ගරුත්වයත්, එසේම කිසිදු ප්‍රභේදයකින් තොරව එකී අයිතිවාසිකම් සුරක්ෂිත කළ යුතුය යන්නත් සඳහන් වේ. එසේම සමානාත්මතාවයේ මූල ධර්මය තහවුරු කිරීමෙන්ද විශේෂයෙන් පහත සඳහන් වගන්ති මගින්ද ආබාධිත පුද්ගල අයිතිවාසිකම් තහවුරු වේ.

22. සමාජයට අයත් සෑම පුද්ගලයකුටම සමාජ ආරක්ෂාව හිමි වේ. සෑම රාජ්‍යකම සංවිධානය හා සම්පත්වලට අනුකූලව තමන්ගේ ගරුත්වයටත්, තම පෞරුෂයේ වර්ධනයටත් අත්‍යාවශ්‍ය වන ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතීන් ජාතික ප්‍රයත්නයන් ගෙන් හා ජාත්‍යන්තර සහයෝගීතාව යෙන්ද ඒ ඒ රාජ්‍යයන්ගේ සංවිධාන හා සම්පත් වලට අනුකූලව සාක්ෂාත් කර ගැනීමේ හිමිකම සෑම පුද්ගලයකුටම ඇත.

23 (1) වැඩ කිරීමටත්, තම රැකියාව නිදහස්ව තෝරා ගැනීමටත්, සාධාරණවූත් යුක්ති සහගතවූත්, වැඩ කිරීමේ පහසුකම් ලැබීමට මෙන්ම විරැකියාවෙන් ආරක්ෂාව ලැබීමටත් සැම පුද්ගලයකුටම හිමිකම ඇත.

23 (3) වැඩ කරන සැම පුද්ගලයකුටම තමන්ට හා තම පවුලට මිනිස් ගරුත්වය රැකෙන ජීවිතයකට අවශ්‍ය සාධාරණ වැටුපක් ලැබීමටත් අවශ්‍ය වුවහොත් අවශේෂ සමාජ ආරක්ෂාවනට රැකවරණ අත්කර ගැනීමටත් අයිතිය ඇත.

27 සමාජයේ සංස්කෘතික ජීවිතයට නිදහසේ සහභාගී වීමටත් කලාවෙන් ආශ්වාදය භුක්ති විඳීමට හා විද්‍යාත්මක දියුණුවට සහභාගි වී ප්‍රතිඵල භුක්ති විඳීමටත් සැම පුද්ගලයකුටම අයිතිය ඇත.

ආබාධිත පුද්ගලයන් පිළිබඳව කරන ලද ජාත්‍යන්තර සමීක්ෂණ අනුව පහත සඳහන් අයිතිවාසිකම් පිළිබඳව ඔවුනට සහාය ලබාදීමත්, ඔවුන් සමාජ සංවර්ධනයට හවුල් කරගත යුතු බවටත්, පිළිගෙන ඇත.

1. වැඩ කිරීමේ අයිතිය
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 23)

2. සමාජ ආරක්ෂාව ලැබීමේ අයිතිය
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 22)

3. අධ්‍යාපන ලැබීමේ අයිතිය
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 26)

4. මානසික හා ශාරීරික සෞඛ්‍ය අයිතිය
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 25)

5. විවාහවීමට හා පවුල් ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 20)

6. එක්රැස්වීම, හා සමාගම් පැවැත්වීම අයිතිය
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 11)

7. මත දැරීමට හා අදහස් ප්‍රකාශ කිරීම
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 19)

8. සෘජුව හෝ නියෝජිතයන් මගින් පාලන බලයට හවුල්වීමේ අයිතිය
(මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය 21)

## ජාත්‍යන්තර ප්‍රඥප්ති / ප්‍රකාශණ හා ආබාධිත පුද්ගල අයිතිවාසිකම්

1948 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශණය

1968 යුනෙස්කෝ සමුළුවේදී ආබාධිත පුද්ගලයන් සම්බන්ධ

විශේෂ අධ්‍යාපනය කුමක්ද යන්න නිර්වචනය කිරීම

1971 එක්සත් ජාතීන්ගේ මන්ද මානසික පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශණය.

1975 එක්සත් ජාතීන්ගේ ආබ ා පුද්ගලයන් සඳහා වූ විශේෂ අයිතිවාසිකම් ප්‍රකාශණය.

1981 අන්තර් ජාතික ආබාධිත පුද්ගලයින්ගේ වර්ෂය බවට ප්‍රකාශ කිරීම

1983 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආබාධිත පුද්ගලයන් සම්බන්ධ වැඩ සටහන. එහිදී සාමාජික රටවල් ආබාධිතයන් සම්බන්ධව පහත සඳහන් ක්‍රියාමාර්ගයන් ගැනීමට බැඳී සිටී.

1. සෑම මට්ටමකම සැලසුම් සංවිධානය හා මුදල් කටයුතු ක්‍රියාත්මක කිරීම.

2. අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නීති, නෛතික පසුබිම හා බලපෑම් කිරීම.

3. පූර්ණ සහභාගිත්වයට ඇති බාධක ඉවත් කිරීම.

4. ආබාධිතයන් සඳහා සමාජයීය, පෝෂණ, වෛද්‍ය, අධ්‍යාපන හා වෘත්තිය පුනරුත්ථාපන පහසුකම් සැලසීම.

5. ඒ සඳහා අදාල ආයතන, පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ඇති කිරීම.

6. ආබාධිතයින්ගේ ආයතන ඇති කිරීමටත් වර්ධනයටත් ආධාර කිරීම.

7. ආබාධිතයන් ඇතුළු සෑම පුද්ගලයින්ටම මෙම වැඩ සටහන් ප්‍රමිතිකරණය කිරීම.

8. ලෝක ආබාධිතයන් පිළිබඳ වැඩ සටහන් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.

9. මෙම වැඩ සටහන පිළිබඳ තාක්ෂණික හා සහයෝගිතා වැඩ සටහන් ආරම්භ කිරීම.

10. ආබාධිතයන් හා ඔවුන්ගේ සංවිධානවලට මෙම ලෝක වැඩ සටහන් සම්බන්ධ අංශ වර්ධනය සඳහා සහාය දීම.

144. ප්‍රජා මට්ටමේ සේවය කරන ගුරුවරුන් සමාජ සේවකයින්, වෘත්තීය සෞඛ්‍ය සේවා නිලධාරීන්, පරිපාලකයින්, රජයේ සැලසුම්කරුවන්, ප්‍රජා නියාමකයින්, පූජ්‍ය පක්ෂය, පවුල් උපදේශකයින් ආදී සියලු දෙනාම ආබාධිතයන් පුනරුත්ථාපනයේ පෙරමුණ ගත යුතුය.

1989 ළමා අයිතිවාසිකම් පිලිබඳ ප්‍රඥප්තියේ 23 (1) වන වගන්තිය

මානසික හෝ කායික දුබලතා ඇති ළමයාට පූර්ණ හා සාධාරණ ජිවිතයක් භුක්ති විඳීමට අයිතියක් ඇති බවත්, ප්‍රජාවේ ක්‍රියාකාරි සහභාගිත්වයට ඉඩ සලසන තත්වයන් සුරක්ෂිත කිරීමට රාජ්‍ය පාර්ශ්වයන් බැඳී සිටී.

1990 සැමට අධ්‍යයනය පිලිබඳ විශ්ව ප්‍රඥප්තිය ආබාධිතයන්ගේ ඉගෙනීමේ අවශ්‍යතා පිලිබඳව විශේෂ අවධානය යොමුවිය යුතුය. අධ්‍යාපන පද්ධතියේම අංගයක් ලෙස සලකා සෑම වර්ගයකම ආබාධිතයන්ට අධ්‍යාපනය සඳහා පිය නැගීමට සමාන ඇතුළුවීමේ අවස්ථා සැපයීමට පියවර ගත යුතුය.

## ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (ICESCR)

**1994 II** සැසියේදී ආබාධිත නිසා වෙනස් කමකට භාජනය නොකළ යුතුය යන තීරණය.

## අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO)

ආබාධිත කම්කරුවන් ගැන විශේෂිතව සඳහන් කරණු අතර ඔවුනට වෘත්තීය පුහුණුව හා රැකියා අවස්ථා සැලසීම ගැන සඳහන් කරයි. 1955 අංක 99 නිර්දේශය.

## එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)

1980 සිට ආබාධිත ළමුන්ට සාමාන්‍ය පරිසරය තුළ වර්ධනය වීමට අවස්ථාව සලසමින් ආධාර දෙමින් පවුල් හා ප්‍රජා සම්පත් ශක්තිමත් කිරීම කරයි.

## එක්සත් ජාතීන්ගේ කර්මික සංවර්ධන සංවිධානය (UNIDO)

ආබාධිත නිවාරනයට අවශ්‍ය ද්‍රව්‍යය හා තාක්ෂණ උපකරණ නිපදවීම.

## විශ්ව තැපැල් සංවිධානය (UPU)

## එක්සත් ජාතීන්ගේ විපත් සහන සමායෝජිත කාර්යාලය (UNDRO)

දැනටමත් ආබාධිත වී ඇති අයට මුහුණපෑමට සිදුවිය හැකි විපත්වලට සහන සැලසීම.

## සරණාගතයන් සඳහා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR)

## ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO)

ආබාධිත මගීන්ට ගුවන් පහසුකම් සැලසීම සම්බන්ධව සාමාජික රටවල් අනුගමනය කළ යුතු නිර්දේශ ඉදිරිපත් කිරීම.

ආබාධිතයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව පිළිගත් එකඟතා

### රැකියා අවස්ථාව

- රක්ෂිත කම්හල්, රක්ෂිත ප්‍රදේශ හා වෙන් කළ තනතුරු ඇති කිරීම තනතුරුවල සලාක ක්‍රම ලබා දීම.

- ආබාධිතයන් පුහුණු කර රැකියා සපයන සේවා යෝජකයාට විශේෂ සහනාධාර ලබා දීම.

- වැඩහලේ උපකරණ ආබාධිතයාට යෝග්‍ය පරිදි සැකසීමෙන් වැඩි රැකියා අවස්ථා සැලසීම.

### පොදු පහසුකම්

දුම්රිය බස්නැවතුම්වල අවශ්‍ය පහසුකම් ඇති කිරීම, පඩු දොරටු ඉවත් කිරීම, පඩිපේළි, උස දුරකථන පෙට්ටි, වැසිකිළි මෙවා ආබාධිතයාට ප්‍රයෝජනය ගත හැකි පරිදි පැවතීම (මේ නිසා බොහෝ ආබාධිතයන් ක්‍රියාකාරි බවෙන් ඈත්ව සිටීම.)

### විනෝදය

- ආපනශාලා සිනමා, ශාලා, රඟහල්, පුස්තකාල, නිවාඩු නිකේතන, ක්‍රීඩාගාර, හෝටල් වෙරළ පහසුකම් සැලසීම.

- නැටුම් ගැයුම් ආදී සංස්කෘතික කටයුතු සඳහා අවස්ථාව ලබා දීම.

## ක්‍රීඩා

කාර්ය මණ්ඩල පුහුණුව, තරග හා සේවා සැපයීම.

## මාධ්‍ය භාවිතය

සංවේදී නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම, ආබාධිත අයිතිවාසිකම් පිළිබඳව හා ඔවුන් සම්බන්ධ මාධ්‍ය භාවිතය ගැන මාධ්‍ය පුහුණු පාඨමාලාවලට ඇතුලත් කිරීම.

## ආබාධිතයන්ට පහසුකම් සැලසීමට සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සංගමය මහලේකම් කාර්යාලයට සම්බන්ධ ආයතන

- මිනිස් අයිතිවාසිකම් පිළිබඳ අංශය
- ප්‍රවෘත්ති, ආර්ථික හා සංවර්ධන දෙපාර්තමේන්තුව
- සංවර්ධනය සඳහා වූ තාක්ෂණික සහයෝගිතා දෙපාර්තමේන්තුව
- මහජන ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
- විෂ මත්ද්‍රව්‍ය අංශය හා ගවළද හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මණ්ඩලය

## ආබාධිත පුනරුත්ථාපන වැඩ සටහනට සම්බන්ධ කලාපීය ආයතන

- අඩිස් අබාබා හි පිහිටි අප්‍රිකාව සඳහා වූ ආර්ථික කොමිසම
- ජිනීවා හි යුරෝපය සඳහා වූ ආර්ථික කොමිසම
- සන්තියෝගි හි පිහිටි ලතින් ඇමරිකාව සඳහා වූ ආර්ථික කොමිසම
- බැංකොක් හි පිහිටි ආසියාව හා පැසිෆික් රටවල් සඳහා වූ ආර්ථික කොමිසම
- බැග්ඩෑඩ් හි පිහිටි බටහිර ආසියාව සඳහා වූ ආර්ථික කොමිසම

## ආබාධිතයන් සඳහා දැනට ක්‍රියාත්මක වන ජගත් වැඩ සටහන්

- එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සම්මත වූ කාර්මික සහයෝගිතාව සඳහා වූ නියෝජනය අංක 3405 එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල 1980
- අනාථයන් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය
- මැද පෙරදිග පලස්තීන අනාථයන් සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආධාර හා වැඩ ආයතනය
- එක්සත් ජාතීන්ගේ ව්‍යසන ආධාර සහයෝගිතා කාර්යාලය

- මානව ජනාවාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය

- එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය

# ආබාධිතයන්ගේ අයිතිවාසිකම් හා ශ්‍රී ලංකා නීති

## හැඳින්වීම

ශ්‍රී ලංකා ඉතිහාසයේ ක්‍රි ව. 04 පමණ කාලයේදී බුද්ධදාස රජතුමා විසින් අංගවිකල පුද්ගලයින් සඳහා රෝහලක් ඇති කල බව සඳහන්වේ. එම රජුගේ පුත්‍ර උපතිස්ස රජ විසින්ද ඒ ආකාරයෙන්ම ක්‍රියා කළ බවද සඳහන්ය.

එසේම පුරාතන බඩිග නමින් හඳුන්වන ජන කොටස තම මාළු පංගුවෙන් කොටසක් වැන්දඹුවන් සඳහාද තවත් කොටසක් ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් වෙන් කරන ලද බවද කිය වේ. මේ අනුව ශ්‍රී ලාංකික ජන සමාජය තුල ආබාධිතයන් පිළිබඳව සංවේදී භාවයක් දැක් වූ බව පෙනේ.

වර්තමාන ශ්‍රී ලංකා නීති පද්ධතිය දෙස බලන විට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) හා 12 (2) වගන්ති වැදගත් වේ.

මේ අනුව සියලු දෙනාම සමානාත්මතාවයෙන් සැලකිය යුතු බවත්, වෙනස් කමකට භාජනය නොකළ යුතු බවත් මූලික අයිතිවාසිකමක් ලෙස තහවුරු කර ඇත.

මේ අනුව ආබාධිත පුද්ගලයන්ටද සමාන අවස්ථා හා සැලකිලි ලැබීමේ අයිතිය ශ්‍රී ලංකා නීතිය තුල පවතී.

## 1996 අංක 28 දරණ පනත

ආබාධිත පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාම විශේෂිත වූ පනතක් ලෙස මෙම පනත ඉදිරිපත් කර ඇත.

මේ යටතේ ජාතික සභාවක් පිහිටුවේ.

| | | |
|---|---|---|
| සභාවේ සාමාජික සංඛ්‍යාව 23 | - | සභාපති - අදාල අමාත්‍යවරයා ලේකම් - අදාල අමාත්‍යාංශයේ ලේකම් |
| සාමාජික සංඛ්‍යාව 21 | - | 13ක්ස්වේච්ඡාසංවිධානවලින් 9 ක් විවිධ (වෘත්තීක, නිළධාරී, පළාත් පාලන ආයතන ආදී වශයෙන්) |

ආබාධිත තැනැත්තන් සඳහා ජාතික මහ ලේකම් කාර්යාලයක් පිහිටුවේ.

අදාල රීති සෑදිය හැකියි.

මහ ලේකම් කාර්යාලයේ

| | |
|---|---|
| කාර්යයන් 12 | ආබාධ සහිත තැනැත්තාගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, අභියාවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමට වග බලා ගැනීම සභාවේ ප්‍රධාන කාර්යය වේ. |

කාර්යයන් 13 ඉහත කාර්යයට අමතරව,

I ඉහත කාර්යය සඳහා ආණ්ඩුවට උපදෙස් දීම.

II අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු පළාත් පාලන ආයතන, වෙනත් රාජ්‍ය ආයතන පෞද්ගලික අංශ හා සංවිධාන විමසා අවශ්‍ය පියවර ගැනීම.

III ආබාධිත තැනැත්තන් ප්‍රවර්ධනයට අවශ්‍ය යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීම

ආබාධිත තැනැත්තන් සම්බන්ධ අන්තර් ජාතික සම්මුතිය ආණ්ඩුව පිළිගනු ලබනු බවට හා අනුගමනය කරනු ලබන බවට වග බලා ගැනීම ඇතුළු අදාල ස්ථාන පරීක්ෂාව, ආයතන පිහිටුවීම, වෘත්තීය පුහුණුව ලබා දීම, ජනතාව දැනුවත් කිරීම ආදී විශාල කාර්ය භාරයක් පැවරී ඇත.

එසේම මෙම පනතේ 23 වන වගන්තිය වැදගත් වේ.

සේවයට බඳවා ගැනීමේදී හෝ යම් අධ්‍යාපන ආයතනයකට ඇතුලත් කර ගැනීමේදී ආබාධය නිසා වෙනස් කමකට භාජනය නොකළ යුතුය.

24 වන වගන්තිය මගින් මෙම අයිතිවාසිකම් උල්ලංඝණය වූ විට මහාධිකරණය මගින් සහන ලබා ගැනීමට හැකි වේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමකදී විධායක හා පරිපාලනමය ක්‍රියාවක් මත එය සිදුවිය යුතු බවට සඳහන් වීම නිසා පෞද්ගලික අංශය ආවරණය නොවේ. මෙහිදී පෞද්ගලික අංශයද ඇතුලත් වන අතර, ශ්‍රේෂ්ඨාධිකරණය නොව මහාධිකරණයකින් සහන ලබා ගැනීමට පුලුවන.

## ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතිවන මූලික අයිතිවාසිකම්

---

**සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස**

10. සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැලඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහසද ඇතුළුව සිතීමේ නිදහසට හෘද සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේය.

**වධ හිංසා වලින් නිදහස**

11. කිසිම තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකල යුත්තේය.

**සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම**

12. (1) නීතිය පසිඳිලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය.

(2) කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව ද කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය:

එසේ වුවද රජයේ සේවයේ, අධිකරණ සේවයේ පළාත් පාලන සේවයේ නැතහොත් යම් රාජ්‍ය

සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තියක හෝ ධූරයක කාර්ය ඉටුකිරීම සඳහා යම් තැනැත්තෙකු යම් භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ සේවා නියුක්තිය හෝ ධූරය සඳහා සුදුසුකමක් වශයෙන් ඒ භාෂාව පිළිබඳ එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළදී ලබා ගත යුතු යයි එවැනි තැනැත්තෙකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය:

එසේම තවදුරටත්, එවැනි යම් සේවා නියුක්තියක හෝ ධූරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවලදී, ඒ සේවා නියුක්තියට හෝ ධූරයට හෝ ඇතුලත් කර ගැනීමේ සුදුසු කමක් වශයෙන් යම් තැනැත්තෙකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යයි නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(3) වර්ගය, ආගම, භාෂාව, කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් හැර වූ හේතුවක් මත හෝ වෙළඳ සැල්වලට, පොදු භෝජනා ගාරවලට, ආපනශාලාවලට, පොදු විනෝද ස්ථානවලට හෝ තම තමාගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථානවලට ඇතුළුවීම සම්බන්ධයෙන් යම් අශක්තතාවකට, බැඳීමකට, සීමා කිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම

සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තියක හෝ ධූරයක කාර්ය ඉටුකිරීම සඳහා යම් තැනැත්තෙකු යම් භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ සේවා නියුක්තිය හෝ ධූරය සඳහා සුදුසුකමක් වශයෙන් ඒ භාෂාව පිළිබඳ එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළදී ලබා ගත යුතු යයි එවැනි තැනැත්තෙකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය:

එසේම තවදුරටත්, එවැනි යම් සේවා නියුක්තියක හෝ ධූරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවලදී, ඒ සේවා නියුක්තියට හෝ ධූරයට හෝ ඇතුලත් කර ගැනීමේ සුදුසු කමක් වශයෙන් යම් තැනැත්තෙකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යයි නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(3) වර්ගය, ආගම, භාෂාව, කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙළඳ සැල්වලට, පොදු භෝජනා ගාරවලට, ආපනශාලාවලට, පොදු විනෝද ස්ථානවලට හෝ තම තමාගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථානවලට ඇතුළුවීම සම්බන්ධයෙන් යම් අශක්නුතාවකට, බැඳීමකට, සීමා කිරීමට නැතහොත් කොන්දේසියකට කිසිම

තැනැත්තෙක් යටත් නොවන්නේය.

(4) කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනුනීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධි විධාන සැලැස්වීම මේ ව්‍යාවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේය.

අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම.

13. (1) නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය. යම් තැනැත්තෙකු සිර භාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය.

(2) අත් අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීමේ හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික

නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය.

(3) වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේද ඒ තැනැත්තාට නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකවම හෝ නීතිඥවරයෙකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේය.

(4) නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස, කිසිම තැනැත්තෙකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තෙකු බන්ධනාගාර ගත කිරීම හෝ නොකළ යුත්තේය. එහෙත් විමර්ශනයක් පවත්වන තෙක් හෝ නඩු විභාගයක් පවත්වනතෙක් හෝ යම් තැනැත්තෙකු සිර භාරයට ගැනීම, අත්අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම දඬුවමක් නොවන්නේය.

(5) වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂී යයි

පූර්වානුමත කළ යුත්තේය.

එසේ වුවද විශේෂ වූ සිද්ධීන් ඔප්පු කිරීමේ, භාරය, චූදිත තැනැත්තෙකු වෙත නීතියෙන් පවරනු ලැබිය හැක්කේය.

(6) යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේදී ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වරදක් නොවී නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙකු වරදකට වරදකරුවෙකු නොවිය යුත්තේය. තවද යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඒ වරද සම්බන්ධයෙන් බල පැවැත්වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකල යුත්තේය.

යම් ක්‍රියාවක් කල හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේදී එය ජාතීන්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වූ විට, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කවර වූ හෝ තැනැත්තෙකු නඩු විභාග යට භාජනය කොට දඬුවම් කිරීමට මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවකින් හානියක් නොවන්නේය.

යම් වරදක් සඳහා නියම කරනු ලබන අවම දන්ඩනය ඒ වරද සිදු කල අවස්ථාවේදී ඒ වරද සඳහා නියමිතව තිබුණු උපරිම දණ්ඩනය නොඉක්මවන්නේ නම් ඒ වරද සඳහා එකී අවම දණ්ඩනය පනවන ලෙස නියම කිරීම මේ ව්‍යවස්ථාවේ විධානවිධි කඩකිරීමක් නොවන්නේය.

(7) ආගමික හා විගාමික පනතේ හෝ 1967 අංක 14 දරණ ඉන්දු ලංකා ගිවිසුම් (ක්‍රියාත්මක කිරීමේ) පණතේ හෝ එකී පනත් වෙනුවට ආදේශ කිරීම සඳහා පනවනු ලබන වෙනත් නීතියක් හෝ විධිවිධාන යටතේ කරනු ලබන ඉවත් කිරීමේ නියමයක නැතහොත් රටින් පිට කිරීමේ නියමයක හේතුවෙන් යම් තැනැත්තෙකු සිරභාරයට ගැනීම, අත්අඩංගුවේ තබා ගැනීම, රඳවා තබාගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීමේ මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේය.

භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යම් ඊම් යනාදියේ නිදහස

14. (1) සෑම පුරවැසියෙකුටම -

(අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහසට;

(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට:

(ඇ) සමාගමයේ නිදහසට:

(ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහසට:

(ඉ) එකලාව හෝ අන් අය හා සමග ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව, තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණකිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට:

(ඊ) එකලාව හෝ අන් අය හා සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්තිවිඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිතා කිරීමේ නිදහසට:

(උ) එකලාව හෝ අන් අය හා සමග යම් නීත්‍යානුකූලව රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට:

(ඌ) ශ්‍රී ලංකාව තුළ යාම් ඊමේ නිදහසට සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට:

සහ

(එ) ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට හිමිකම් ඇත්තේය.

(2) වෙනත් යම් කිසි රටක පුරවැසියකුව නොසිටියදී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාවෙහි ස්ථිරව සහ නීත්‍යනුකූලව පදිංචිව සිටියා වූ සහ එසේ දිගටම පදිංචිව සිටින්නාවූ තැනැත්තෙකුටද ආණ්ඩු ක්‍රම ව්‍යාවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ සිට අවුරුදු 10 ක කාලයක් තුළ මේ ව්‍යාවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලැබ ඇති අයිතිවාසිකම් වලට හිමිකම් ඇත්තේය.

**මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා.**

15. (1) 13 වන ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනු ව්‍යවස්ථාවලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට පමණක් යටත්වය. මෙම අනු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත්කාලයේ අදාල වන නීතිය යටතේ සාදන ලද නියෝග සද ඇතුලත් වන්නේය.

(2) 14 වන ව්‍යාවස්ථාවේ (1) වන අනුව්‍යාවස්ථාවේ (අ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික

අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගිතාව, ක්‍රියාත්මක වියහැක්කේද තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාසය හෝ වරදකට පෙළඹවීම හා සම්බන්ධව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය

(3) 14 වන ව්‍යාවස්ථාවේ (1) වන අනුව්‍යාවස්ථාවේ (ආ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගිතාවය තහවුරු කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි කිරීම් වලට යටත්වය

(4) 14 වන ව්‍යාවස්ථාවේ (1) වන අනුව්‍යාවස්ථාවේ (ඇ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය

(5) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා හෝ:-

(අ) යම් වෘත්තියක යෙදී සිටීමට හෝ යම් රැකියාවක්, කර්මාන්තයක් වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් පවත්වාගෙන යෑමට අවශ්‍ය වෘත්තීය, කාර්මික අධ්‍යාපනික, මූල්‍ය සහ වෙනත් සුදුසු කම් සම්බන්ධයෙන් සහ එම මූලික අයිතිවාසිකමට හිමිකම් ලබන තැනැත්තාට බල පැවරීම සහ ඒ තැනැත්තාට විෂයෙහි විනය පාලනය සම්බන්ධයෙන් සහ

(ආ) රජය විසින් හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ යම් කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, කාර්මික ව්‍යාපාරයක්, සේවාවක්, හෝ ව්‍යවසායක් පුරවැසි සහභාගිත්වය නොමැතිව හෝ පුරවැසියකොටසක

සහභාගිත්වය ඇති හෝ අන්‍යාකාරයකින් හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය.

(6) 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඌ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය.

(7) 12 වන ව්‍යවස්ථාවේ, (13) වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන අනුව්‍යවස්ථාවලින් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශකොට පිළිගෙන ඇති සියළුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද රාජ්‍ය ආරක්ෂාවද, රටේ යථා පැවැත්මද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍යයහෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නම් වැදැරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඒට නිසි පරිදි ගරු කරන බවට වග බලා ගැනීම

පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභ සාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍ය ඇ සපුරාලීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත්කාලයේ අදාල වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුලත් වන්නේය.

(8) 12 වන ව්‍යවස්ථාවේ, (1) වන අනුව්‍යවස්ථාවෙන්, (13) වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශකොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන්ට, පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ රටේ යථා පැවැත්ම භාරව සිටින වෙනත් හමුදාවල සාමාජිකයන්ට අදාල වීමේ දී එම අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද ඔවුන්ගේ කාර්යයන් යථා පරිදි ඉටු කරවා ගැනීම සාහ ඔවුන් අතර විනය පවත්වාගැනීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව.

පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බල පවත්වන බව.

16. (1) පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති අතුරෙන් යම් කිසි ලිඛිත නීතියක් හෝ ලිඛිත නොවූ නීතියක්

මේ පරිච්ඡේදයේ මෙයට ඉහතින් ඇති විධිවිධාන වලට අනුකූල නොවුවද එකී සියළු පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන්නේය.

(2) කවර වූ හෝ පවත්නා ලිඛිත නීතියක් දඬුවමක් ලෙස පිළිගනු ලැබූ කවර හෝ ආකාරයක දඬුවමකට කවර වූ හෝ තැනැත්තෙකු නිසි අධිකරණයක ආඥාවක් පිට යටත් කිරීම මේ පරිච්ඡේදයේ විධිවිධාන කඩ කිරීමක් නොවන්නේය.

විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ප්‍රතිකර්ම.

17. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකුට හිමිවන යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝණය කර තිබීම හෝ උල්ලංඝණය කිරීමට ආසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් 126 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේය.

මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය සහ ඒ බලය ක්‍රියාත්මක කිරීම

126. (1) III වන පරිච්ඡේදයෙන් හෝ IV වන පරිච්ඡේදයෙන් හෝ ප්‍රකාශ කොට පිළිගන්නා ලද යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක්

මගින් කඩ කිරීම හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාගකොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේය.

(2) තමාට සම්බන්ධ එවැනි යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක ක්‍රියාවක් මගින් හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කොට ඇති බවට හෝ කඩ කිරීම අත්‍යාසන්නව පවතින බවට යම් තැනැත්තෙකු විසින් දෝෂාරෝපණයක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින්ම නැතහොත් ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයෙකුගේ මාර්ගයෙන්, එතැන්පටන් මාසයක් ඇතුළත, එම කඩ කිරීමෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඇයැද සිටින ඉල්ලීමක්, තත්කාලයේ බලපවත්නා අධිකරණ රීති වලට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණය අමතා ඉදිරිපත් කරන ලිඛිත පෙත්සමක් මගින් කළ හැක්කේය. එවැනි ඉල්ලීමක් පිළිබඳ ක්‍රියා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් පසුව පමණක් එවැනි ඉල්ලීමක පිළිබඳව ක්‍රියා කරගෙන යා හැක්කේය. එසේ අවසර ඉල්ලා සිටින විට අවස්ථානෝචිත පරිදි

ඒ අවසරය ප්‍රධානය කිරීම හෝ අවසර දීම ප්‍රතික්ෂේප කිරීම හෝ විනිශ්චයකාර වරයන් දෙදෙනෙකුට නොඅඩු සංඛ්‍යාව විසින් කල හැක්කේය.

(3) හේබියස් කෝපුස්, සර්ටියෝරාරි, තහනම් පොසිඩෙන්ඩෝ මැන්ඩාමුස් හෝ ක්වෝ වොරොන්ටෝ ස්වභාවයේ වූ රිට්ආඥා සඳහා කරන ලද ඉල්ලීමක් අභියාචනාධිකරණයෙහි විභාග කිරීමේදී ඒ ඉල්ලීමේ පාර්ශව කරුවෙකු විසින්, iii වන පරිච්ඡේදයෙන් හෝ iv වන පරිච්ඡේදයේ විධිවිධාන කඩකර ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව ඇති බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇති බවට ඒ අධිකරණයට පෙනී ගිය අවස්ථාවක ඒ කාරණය නිර්ණය කිරීම සඳහා ඒ අධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නොපමාව ගොනු කළ යුත්තේය.

(4) මෙම ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ සහ (3) අනුව්‍යවස්ථාවේ සඳහන් යම් පෙත්සමක් හෝ යොමු කිරීමක් සම්බන්ධයෙන් අවස්ථාගත කරුණු අනුව යුක්ති සහගත යයි හා සාධාරණයයි ශ්‍රේෂ්ඨාධිකරණ සලකන සහනයක් ප්‍රධානය කිරීම හෝ විධානයක් දීමට හෝ මූලික අයිතිවාසිකමක් හෝ භාෂා

අයිතිවාසිකම කඩ වී නොමැති බව ඒ අධිකරණයේ මතය වේ නම් ඒ කාරණය අභියාචනාධිකරණයට ආපසු යොමු කිරීමට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත්තේය.

(5) මේ ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද යම් පෙත්සමක් හෝ කරන ලද යම් යොමු කිරීමක් පිළිබඳව ඒ පෙත්සම ඉදිරිත් කරනු ලැබූ නැතහොත් යොමු කිරීම කරනු ලැබූ දින සිට මාස 02 ක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කොට කටයුතු නිම කළ යුත්තේය.

1999 දී මෙම පනත යටතේ අතුරු නීති සකසා ඇත. ඒ අනුව,

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ආයෝජන මණ්ඩලය විසින් ගොඩනැගිලි, පාරවල්, දුම්රිය මාර්ග ආදිය සැලසුම් කිරීමේදී මේ සම්බන්ධව ක්‍රියා කිරීමට වෙනම අංශ ඇති කළ යුතුය.

රක්ෂණයේදී ආබාධිතයන්ට ඉහල වාරික අයකිරීම අඩු කළ යුතුය.

එහෙත් මෙම යෝජනා භාවිතයේදී ක්‍රියාත්මක වන පරිසරයක් නැත

රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 27/88

රැකියාවලින් 3% ක් ආබාධිතයන් සඳහා වෙන් කළ යුතුය. ආබාධිතයන් සම්බන්ධ ගුරුවරුන්ට 10% ක් අතිරේක පාරිශ්‍රමිකයක් ලබා දීම.

1912 - දෙහිවල, රත්මලාන අඳ ගොළු බිහිරි පාසල ඇති කිරීම

1955 - යාපනයේ කයිතඩිනවිල් දෙමළ මාධ්‍ය අඳ ගොළු බිහිරි පාසල ඇති කිරීම

1985 - බ්‍රේල් මුද්‍රණාලය ඇති කිරීම

1977 - මහරගම මේ සඳහා විශේෂ ගුරු පුහුණු පාඨමාලාවක් ආරම්භ කිරීම.

## පාසැල්

| | |
|---|---|
| ශ්‍රව්‍ය දෘෂ්‍යාබාධිතයින් සඳහා විශේෂ පාසැල් | 19 |
| මන්ද මානසික ළමුන් සඳහා පාසැල් | 11 |
| කායික දුබලතා ළමුන් සඳහා | 03 |

## සේවා සලසන ස්වේච්ඡා ආයතන

1. අන්ධ ජනසේවා මණ්ඩලය - කොම්පඤ්ඤවීදිය
2. බිහිරි ජනසේවා මණ්ඩලය - රාජගිරිය
3. මන්ද මානසිකයන් සඳහා ලංකා ආයතනය
4. ලෝක දර්ශන ආයතනය ඇතුළු ආයතන 14 ක් ක්‍රියාත්මක වේ.

ජාත්‍යන්තර ආයතන

ඩියා සංවිධානය

යුනෙස්කෝ සංවිධානය

නොරාඩ් ආයතනය

සීඩා සංවිධානය

බ්‍රිතාන්‍ය ළමා ආරක්ෂක අරමුදල

ජාත්‍යන්තර සැලසුම

ලෝක සෞඛ්‍ය සංවිධානය

ලෝක කම්කරු සංවිධානය

ජයිකා ආයතනය

## අධිකරණ තීරණ

ආබාධිත පුද්ගලයින්ගේ මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරයකු වන " ඉදිරිය" නම් ස්වෙච්ඡා සංවිධානය මගින් ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද පෙත්සමක් විභාග කිරීමෙන් අනතුරුව 2009 ඔක්තෝම්බර් 16 දිනැතිව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීරණය මෙහිදී වැදගත් වේ. මෙම පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස කැබිනට් ඇමතිවරු, ප්‍රධාන ලේකම්වරු, ප්‍රධාන ඇමතිවරු හා නාගරික සංවර්ධන අධිකාරියද නම් කර ඇත.

මෙම පෙත්සම තුළදී විශේෂයෙන්ම වැසිකිළි පහසුකම් ආදිය සඳහා පහසු හා සුදුසු ප්‍රවේශය අවශ්‍ය බව දක්වා ඇති අතර පෙත්සම්කාර පාර්ශවය විසින් 1996 අංක 28 දරණ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත හා 2006 අංක 01 දරණ ආබාධිත පුද්ගලයින් හට ප්‍රවේශය පිළිබඳ රෙගුලාසි (Accessibility

Regulations) ) පැවතියද, ඒවා තවමත් පොදු ස්ථානවල භාවිතා කිරීමක් හෝ හඳුනාගෙන නොමැති බවත් දක්වා ඇත.

ප්‍රධාන වශයෙන්ම පොදු ස්ථාන සඳහා ප්‍රවේශ වීමට ආබාධිත පුද්ගලයින්ට පවතින දුෂ්කර තත්වය පිළිබඳව පෙත්සම ඉදිරිපත්ව ඇති අතර පොදු ගොඩනැගිලි සඳහා ප්‍රවේශ වීමට පහසුකම් ඇති කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදි. අධිකරණය මගින් එහිදී ආබාධිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම් නොමැතිව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන ගොඩනැගිලි සැලසුම් අනුමත නොකල යුතු බවටත් දක්වා ඇත.

## ආබාධිත අයිතිවාසිකම් සම්බන්ධ පොදු කරුණු

- ආබාධිතයින්ට අවශ්‍ය සේවා රටක පොදු සේවාවේ කොටසක් විය යුතුය
- සුව කළ නොහැකි අයට තම නිවාස හා ප්‍රජාව තුල හැකිතාක් දුරට සාමාන්‍ය ලෙස ජීවත් වීමට අවස්ථාව සැලසිය යුතුය.
- ආබාධිත පුද්ගලයින්ට උදව්කරමින් ළඟ ජීවත්වන අයට ප්‍රමාණවත් විවේකය, විනෝදය හා පුද්ගලික අවශ්‍යතා සපුරා ගැනීමට උදව් කළ යුතුය.
- සමාජය ගොඩනැගීමට සක්‍රියව දායක කරගත යුතුය (විශ්‍රාම වැටුප් හෝ මහජනාධාර දීම නොවේ).
- දුබලතාවය දෙස නොව හැකියාව දෙස බැලිය යුතුය.

සැකසුම:

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා

# විශේෂ අවශ්‍යතා ඇත්තන්ගේ
## මානව අයිතිවාසිකම්